ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව |
| දිනය | 2017.12.15 |

## සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හා වෙනස් කරන ලද ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු සිතා මතා විකෘති කිරීම, හානි කිරීම හා වෙනස් කිරීමට අදාළ රෙගුලාසි හා පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාමාන්‍ය මහජනතාවගේ අවධානය යොමු කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කර ඇත. ව්‍යවහාර මුදල් නෝට්ටු වල ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාමත්, ඒ මගින් අව්‍යාජ නෝට්ටුවක් හා ව්‍යාජ නෝට්ටුවක් හඳුනාගැනීමේ පහසුවත් අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිරිසිදු මුදල් නෝට්ටු ප්‍රතිපත්තිය හඳුන්වා දී ඇත. රටේ ප්‍රතිරූපය ඉහළ නැංවීමත්, ව්‍යවහාර මුදල් හැසිරවීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමත් මෙම ප්‍රතිපත්තිය හරහා බලාපොරොත්තු වී ඇත.

ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු සිතා මතා විකෘති කිරීම, හානි කිරීම හා වෙනස් කිරීම 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ දඩ මුදලකට යටත් කිරීම හෝ සිරගත කිරීම හෝ එම දඬුවම් දෙකම ලබා දිය හැකි වරදකි. මුදල් නීති පනතේ රෙගුලාසි ඊ (Regulation E) යටතේ සිතා මතා විකෘති කරන ලද, හානි කරන ලද හා වෙනස් කරන ලද නෝට්ටු සඳහා කිසිදු හිමි කම් පෑමක් නොලබන අතර එවැනි නෝට්ටු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රඳවා ගනු ලැබේ. මෙවැනි මුදල් නෝට්ටු අත දරන්නා හට එම නෝට්ටු වල මුහුණත වටිනාකමෙහි අලාභය දරා ගැනීමට සිදු වේ.

තවදුරටත්, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙවැනි සිතා මතා විකෘති කරන ලද, වෙනස් කරන ලද හෝ හානි කරන ලද මුදල් නෝට්ටු ප්‍රතිස්ථාපනය වෙනුවෙන් විශාල මහජන මුදලක් වැය කරමින් මුදල් නෝට්ටු මුද්‍රණය කරනු ලබන ප්‍රමාණය ඉහළ දැමීමට සිදුවන අතර එම මහජන මුදල් එසේ නොවන්නේනම් වඩා වැදගත් අරමුණු වෙනුවෙන් යෙදවිය හැක. එබැවින්, සිතා මතා විකෘති කරන, වෙනස් කරන හෝ හානි කරන ලද මුදල් නෝට්ටු සඳහා කිසිදු ගෙවීමක් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බැඳී නොමැත.

ඒ අනුව, ව්‍යවහාර මුදල් නෝට්ටු සිතා මතා විකෘති කිරීම, හානි කිරීම හා වෙනස් කිරීම යන පුරුදු වලින් වළකින ලෙසද තම අත ඇති එවැනි මුදල් නෝට්ටු 2017.12.31 දින හෝ එම දිනට පෙර ළඟම ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛාව වෙතින් හුවමාරු කර ගන්නා ලෙසද ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. කෙසේවුවද, සිතා මතා විකෘති කිරීමක්, වෙනස් කිරීමක් හෝ හානි කිරීමකින් තොරව මුදල් සංසරණයේ සාමාන්‍ය භාවිතයේදී පළුදු වූ මුදල් නෝට්ටු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා පවත්නා ක්‍රමවේදයන්ට අනුව හුවමාරුකර එහි වටිනාකම ලබා ගැනීමේ හැකියාව තවදුරටත් පවතී.

පිරිසිදු මුදල් ප්‍රතිපත්තියට අනුගත වෙමින් රටෙහි වලංගු මුදල් නෝට්ටු වල අව්‍යාජත්වය සහ වටිනාකම ආරක්ෂා කර ගැනීමට සහය වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටියි.